
නෙත් FM

5 පහේ පන්තිය

01 මෙම රූපවලින් දක්වා ඇති ද්‍රව්‍ය කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ය.


A


B


C


D

එම කාණ්ඩ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

A	B	C	D

(1)


B	D	A	C

(2)

A	D	B	C

(3)

02 මෙම රූපවලින් දක්වා ඇති සතුන් කාණ්ඩ තුනකට වෙන් කළ හැකි ය.


A B C D E F

එම කාණ්ඩ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

A	C	B	E
D	F		

(1)

B	D	A	E
C	F		

(2)

A	D	B	F
C	E		

(3)

★ **පහත දැක්වෙන එක් එක් ප්‍රකාශයට වඩාත් ගැළපෙන වාක්‍ය තෝරා යටින් ඉරක් අඳින්න.**

03 ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

(1) අනවශ්‍ය උත්සාහයක් නොදරන්න.

(2) ප්‍රයෝජනයක් නැති දෙයකට උදවු නොකරන්න.

(3) ගැටුමක් වැඩි කිරීමට තව තවත් උදවු නොකරන්න.

04 පනින්න පෙර සිතා බලන්න.

(1) අනාගතය පිළිබඳ කල්පනා කරන්න.

(2) යමක් කිරීමට පෙර එහි ප්‍රතිඵලය පිළිබඳ ව සිතා බලන්න.

(3) පනින්න පෙර වම සහ දකුණ බලන්න.

05 සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. මේ සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

N	වතුර කේතලය ලිප මත තැබුවා.
P	තේ කොළ සහිත භාජනයට වතුර දැම්මා.
C	වතුර නටන විට ලිපෙන් බෑවා.
R	තේ ගොටුවෙන් පෙරා වෙනත් භාජනයකට දැමුවා.
O	තේ කෝප්පය පානය කළා.
M	සීනි දමා මිශ්‍ර කළා.

N	C	P	R	M	O

(1)

N	C	R	M	P	O

(2)

N	C	M	P	R	O

(3)

★ **අංක 06 ප්‍රශ්නයේ හිස්තැනට වඩාත් ගැළපෙන වචනය දී ඇති පිළිතුරුවලින් තෝරන්න.**


06 වචනයක නිතර ම ඇත්තේ, ...

(1) අකුරු සහ පිල්ලම් ය. (2) අකුරු සහ අර්ථයන් ය. (3) අකුරු සහ දෝෂයන් ය.

07 සචිනිගේ වයස, අචිනිගේ වයසින් අර්ධයකි. අචිනිගේ වයස, විජිනිගේ වයසින් අර්ධයකි. තිදෙනාගේ ම වයස්වල එකතුව අවුරුදු 42ක් නම් සචිනිගේ සහ විජිනිගේ වයස අතර වෙනස අවුරුදු කීය ද?

(1) 16 (2) 18 (3) 20

08 ආහාර, එළවළු සහ කරවිල යන ඒවා අතර සම්බන්ධය දැක්වීමට පහත රූපය ඇඳ තිබේ. මෙහි එළවළු පෙන්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?



(1) A (2) B (3) C

★ **අංක 09 සහ 10 ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රකාශවලට වඩාත් ම ගැළපෙන හේතුව සහිත පිළිතුර තෝරන්න.**

09 ඉගෙනීමට දක්ෂ නිමාලි දිනපතා පාසල් පැමිණෙයි. නමුත් මෑතක සිට ඇයගේ පාසල් පැමිණීම දුර්වල මට්ටමක පවතී. මෙයට හේතුව විය හැක්කේ,

(1) ඇය ඉගෙනීමට අකමැති නිසා ය.

(2) ඇය උදෑසන අවදිවීමට ප්‍රමාද වන නිසා ය.

(3) ඇය නිතර නිතර අසනීප වීම නිසා ය.

10 අස්වැන්න ලබා ගැනීමට ආසන්න ව තිබූ කුඹුරු යාය ම විනාශ විය. මෙයට හේතුව විය හැක්කේ,

(1) සොරු විසින් අස්වැන්න සොරකම් කිරීම.

(2) ගං වතුරට යටවීම.

(3) දැඩි නියඟයක් ඇති වීම.

★ **අංක 11 සහ 12 ප්‍රශ්නවලට දී ඇති තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

අධිවේගී මාර්ගයක් පහත සඳහන් පියවර තුන යටතේ ඉදි කිරීමට සැලසුම් කර තිබුණි.

පියවර	ගත වන කාලය
1	මාස 12 කි.
2	පියවර 1 මෙන් දෙගුණයකි.
3	පියවර 2 මෙන් බාගයකි.
4	පියවර 1 මෙන් හතර ගුණයකි.

11 මෙම අධිවේගී මාර්ගය ඉදි කිරීම 2020 වසරේ ජනවාරි මස ආරම්භ කළේ නම් එය සාදා නිම කළ හැකි වන්නේ කුමන වසරේ ද?

(1) 2026 (2) 2027 (3) 2028

12 මෙහි 3 වන පියවර ආරම්භ වන්නේ කුමන වර්ෂයේ ද?

(1) 2024 (2) 2022 (3) 2023

13 ජගත්ට සති අන්තයේ දින දෙක සහ සෑම බදාදා දිනක ම නිවාඩු ලැබේ. ඔහුගේ බිරිඳට දවසක් හැර දවසක් නිවාඩු ලැබේ. අද ඉරිදා දින දෙදෙනාට ම නිවාඩු ලැබී ඇත. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ලබන ඉරිදාත් ඔවුන් දෙදෙනාට ම නිවාඩු ලැබෙනු ඇත.

(2) ලබන සෙනසුරාදාත් ඔවුන් දෙදෙනාට ම නිවාඩු ලැබෙනු ඇත.

(3) ලබන බදාදාත් ඔවුන් දෙදෙනාට ම නිවාඩු ලැබෙනු ඇත.


14 මීටර 6ක් දිග මීටර 6ක් උස බිත්තියක ගෑමට තීන්ත ලීටර 4ක් අවශ්‍ය වෙයි. මීටර 3ක් දිග මීටර 3ක් උස බිත්තියක ගෑමට අවශ්‍ය තීන්ත ප්‍රමාණය කොපමණ ද?


(1) ලීටර 3 යි. (2) ලීටර 2 යි. (3) ලීටර 1 යි.


15 කැඩපතක් තුළින් ඔරලෝසුවක් දෙස බැලූ විට පෙනෙන වේලාව 9.10 නම් ඔරලෝසුවේ සත්‍ය වේලාව කීය ද?

(1) 2.50 (2) 2.55 (3) 2.45

★ **අංක 16 සහ 17 ප්‍රශ්නවලට පහත දී ඇති පලතුරුවල මිල ගණන් අනුව පිළිතුරු සපයන්න.**







16 අඹ ගෙඩියක හා ඇපල් ගෙඩියක මිල කීය ද?

(1) රු. 60.00 (2) රු. 80.00 (3) රු. 100.00

17 අන්නාසි ගෙඩියක මිල කීය ද?

(1) රු. 130.00 (2) රු. 140.00 (3) රු. 150.00

18 9ත් 99ත් අතර සංඛ්‍යා ලිවීමේ දී 9 ඉලක්කම ලියවෙන වාර ගණන කීය ද?

(1) 20 (2) 18 (3) 17

19 අද සිකුරාදා ය. අනිද්දා 18 වෙනිදා ය. තමාගේ උපන් දිනය ඊයේ යෙදුණු බව පවනි පෙරේදා මා සමඟ කීවා ය. පවනිගේ උපන් දිනය හා දවස කුමක් ද?

(1) 12 වන සඳුදා (2) 13 වන අඟහරුවාදා (3) 14 වන බදාදා

20 පේළියේ හරි මැද සිටි උදාරට ඉදිරියෙන් 8 දෙනෙක් සිටියහ. පේළියේ සිටි සියලු දෙනාගේ මුළු පාදවල එකතුව කීය ද?

(1) 18 (2) 32 (3) 34

21 මිනිසුන් දෙදෙනෙකු එක ම තැනින් පටන් ගෙන ඇවිදගෙන ගිය අතර පැය පහක දී ඔවුන් ගමන් කළ දුර කිලෝමීටර 25කි. පැය දෙකක් තුළ එක් මිනිසෙකු ඇවිද ගිය දුර කොපමණ ද?

(1) 5 km (2) 10 km (3) 15 km

22 ඡායාරූපයේ සිටින පුද්ගලයාගේ පියාගේ එක ම පුතා චාමර ය. කවීන්ගේ පියා චාමර වන අතර සීයා සිරිදාස ය. ඡායාරූපයේ සිටින්නේ කවු ද?

(1) චාමර (2) කවීන් (3) සිරිදාස

23 200යේ බාගයෙන් $\frac{1}{4}$ ට 10ක් එකතු කළ විට පිළිතුර කීය ද?

(1) 25 (2) 35 (3) 45


24 රජයේ රැකියා කරන සියල්ලෝ ම උපාධිධාරීහු නොවෙති. එසේ නම්,

(1) රජයේ රැකියා කරනුයේ උපාධිය ලත් අය පමණි.

(2) පෞද්ගලික ආයතනවල උපාධිය නොලත් අය පමණක් රැකියාව කරති.

(3) උපාධිය නොලත් අය ද රජයේ රැකියා කරති.

25 A,B,C හා D යන පන්ති හතරේ සිටින ළමයින් සංඛ්‍යාව පහත රූප සටහනෙන් නිරූපණය කෙරේ.



C පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව 12ක් නම් A හා B පන්තිවල සිටින සිසුන් සංඛ්‍යාව අතර වෙනස කීය ද?

(1) 48 (2) 24 (3) 12

26 දිග, පළල හා උස 8 cm බැගින් වූ ලී ඝනකයකින් දිග, පළල හා උස 2 cm බැගින් වන කුඩා ඝනක කීයක් කැපිය හැකි ද?

(1) 64 (2) 32 (3) 16